**සී/ස ලංකා නැව් සංස්ථාව**
**වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය**

# ඇබෑර්තු

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසිභාවය හිමි සහ අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද ඇති සුදුසු අපේක්ෂකයින් පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

| නියෝජ්‍ය කළමනාකරු (මානව සම්පත්)තනතුර - MM 1-1, Gr. II (ඇබෑර්තු 01) | |
|---|---|
| **බාහිර අපේක්ෂකයින්** | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ව්‍යාපාර කළමනාකරණය / විද්‍යාව / වාණිජ්‍යය / අලෙවිකරණය / මානව සම්පත් පිළිබඳ උපාධියක්. **සහ** ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රය තුළ රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක කළමනාකරණ තනතුරක (MM) අවම වශයෙන් වසරක (01) සතුටුදායක සේවාවක් තිබිය යුතුය. |
| **අභ්‍යන්තර අපේක්ෂකයින්** | ඉහත බාහිර අපේක්ෂකයින්ට අදාළ වන්නා වූ සුදුසුකම්. **හෝ** අදාළ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM 1-2) කාණ්ඩයේ හෝ ඊට වැඩි තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් තිබීම. |
| **වැටුප් පරිමාණය** | MM 1-1- 2025- Rs. (91,690- 10× 2,480-15× 3450- 168,240)<br><br>2026/01/01 දින වැටුපට අනුව තෝරාගත් අපේක්ෂකයා (MM 1:1) II ශ්‍රේණිය හි ආරම්භක ස්ථානය වන රු. 81,710/- තබනු ලැබේ.<br><br>මෙම වැටුපට අමතරව රජය සතු ව්‍යවසායන් සඳහා සියලුම රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ. |

| අභ්‍යන්තර විගණක තනතුර - MM 1-1, GR. II (ඇබෑර්තු 01 ) | |
|---|---|
| **බාහිර අපේක්ෂකයින්** | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් මූල්‍ය, ගිණුම්කරණය හෝ වාණිජ්‍ය පිළිබඳ උපාධිය.<br>**හෝ**<br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම් (Intermediate Level Qualification).<br>**හෝ**<br>කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයේ (CIMA) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම් (Intermediate Level Qualification).<br>**හෝ**<br>සහතිකලත් සහ ආයතනික ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම්(Intermediate Level Qualification).<br>**හෝ**<br>ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA in Accountancy)- ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය (SLIATE) -.<br>**සහ**<br>ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක කළමනාකරණ තනතුරක (MM කාණ්ඩය) ගිණුම්කරණය හෝ මූල්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්ද. |

| | |
|---|---|
| අභ්‍යන්තර අපේක්ෂකයින් | ඉහත සඳහන් බාහිර අපේක්ෂකයින්ට අදාළ වන්නා වූ සුදුසුකම්.<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM 1-2) තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක්. |
| වැටුප් පරිමාණය | MM 1-1- 2025- Rs. (91,690- 10× 2,480-15× 3450- 168,240)<br>2026/01/01 දින වැටුපට අනුව තෝරාගත් අපේක්ෂකයා (MM 1:1) ශ්‍රේණිය II හි ආරම්භක ස්ථානය වන රු. 81,710/- තබනු ලැබේ.<br>මෙම වැටුපට අමතරව රජය සතු ව්‍යවසායන් සඳහා සියලුම රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ. |
| **සහකාර කළමනාකාර තනතුර- (01)- JM 1-2, GR. III (ඇබෑර්තු 03)** | |
| බාහිර අපේක්ෂකයින් | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක කළමනාකරණය හෝ වාණිජ්‍ය ක්ෂත්‍රයෙහි උපාධිය<br>හෝ<br>වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනයේ (එක්සත් රාජධානිය) (Chartered Institute of Shipbrokers (UK)) යෝග්‍යතා පරීක්ෂණයෙන් විෂයන් 03ක් සමත්වීම. |
| අභ්‍යන්තර අපේක්ෂකයින්: | ඉහත බාහිර අපේක්ෂකයින්ට අදාළ වන්නා වූ සුදුසුකම්<br>හෝ<br>ආශ්‍රිත නිලධාරි (MA-3) කාණ්ඩයේ වසර පහක (05) සතුටුදායක සේවය සම්පූර්ණ කර තිබීම.<br>හෝ<br>කළමනාකරණ සහකාර කාණ්ඩයේ (MA 1-2 Gr. II) දෙවන ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර (05) සතුටුදායක සේවය |
| වැටුප් පරිමාණය | JM 1-2- 2025- Rs. (74,010- 10× 1,360-18× 2040- 124,330)<br>2026/01/01 දින වැටුපට අනුව තෝරාගත් අපේක්ෂකයා (JM 1-2) ශ්‍රේණිය II හි ආරම්භක ස්ථානය වන රු. 66,781/- තබනු ලැබේ.<br>මෙම වැටුපට අමතරව රජය සතු ව්‍යවසායන් සඳහා සියලුම රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ. |
| **සහකාර ගණකාධිකාරී තනතුර - JM 1-2, GR. II (ඇබෑර්තු 01)** | |
| බාහිර අපේක්ෂකයින් | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කළමනාකරණ හෝ වාණිජ ක්ෂේත්‍රයේ උපාධියක්<br>හෝ<br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම් (Intermediate Level Qualification).<br>හෝ<br>කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයේ (CIMA) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම් (Intermediate Level Qualification).<br>හෝ<br>සහතිකලත් සහ ආයතනික ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම්(Intermediate Level Qualification).<br>හෝ<br>ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA in Accountancy)- ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය (SLIATE) -. |

| | |
|---|---|
| අභ්‍යන්තර අපේක්ෂකයින් | ඉහත බාහිර අපේක්ෂකයා විසින් අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම<br>හෝ<br>තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ආශ්‍රිත නිලධාරි (MA-3) කාණ්ඩයේ අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.<br>හෝ<br>තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන" MA 1-2(Gr.II) දෙවන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම. |
| වැටුප් පරිමාණය | JM 1-2- 2025- Rs. (74,010- 10× 1,360-18× 2040- 124,330)<br><br>2026/01/01 දින වැටුපට අනුව තෝරාගත් අපේක්ෂකයා (JM 1-2) II ශ්‍රේණිය හි ආරම්භක පියවර වන රු. 66,781/- තබනු ලැබේ.<br><br>මෙම වැටුපට අමතරව රජය සතු ව්‍යවසායන් සඳහා සියලුම රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ. |

| | |
|---|---|
| **ආශ්‍රිත නිලධාරි තනතුර<br>(වාණිජ/ මෙහෙයුම් / අලෙවිකරණ/ කාර්මික / පරිපාලන / ගිණුම්/ විගණන)<br>MA 3, GR. III (ඇබෑර්තු 05)** | |
| බාහිර අපේක්ෂකයින් | බාහිර අපේක්ෂකයින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ව්‍යාපාර කළමනාකරණ / විද්‍යා / කලමණාකරණ/ වාණිජ / අලෙවිකරණය/නාවික ඉංජිනේරු ක්ෂේත්‍රයන්ට අදාළ උපාධියක් |
| වැටුප් පරිමාණය | MA 3- 2025- රු. (53,940- 10× 800-11× 1190- 10×1320-5×1350-94,980)<br><br>2026/01/01 දින වැටුපට අනුව තෝරාගත් අපේක්ෂකයා (MA 3, Gr.III) තුන්වන ශ්‍රේණියේ ආරම්භක වැටුප වන රු. 49,831/- පිහිටවනු ලැබේ.<br><br>මෙම වැටුපට අමතරව රජය සතු ව්‍යවසායන් සඳහා සියලුම රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ. |

**<u>සියලුම තනතුරු සඳහා අදාළ වන සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි</u>**

**වයස් සීමාව - :** වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය . උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පරිවාස කාලය :** බාහිර අයදුම්කරුවන් සඳහා අවුරුදු 03ක් සහ අභ්‍යන්තර අයදුම්කරවන් සඳහා වසර 1 කි.

**ප්‍රතිලාභ**

1. සේ.අ.අ / .සේ.නි.භා.අරමුදලට සංස්ථාවේ දායකත්වය
2. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගත කිරීම් සඳහා රක්ෂණ ආවරණය
3. සම්පූර්ණ පුද්ගල සහ අනතුරු රක්ෂණ ආවරණය
4. භාවිතා නොකල වෛද්‍ය නිවාඩු වලට ගෙවීම්
5. වාර්ෂික ප්‍රසාද දීමනා අදාල පරිදි
6. සහනශීලී නියමයන් මත නිවාස ණය සහ සේවක මණ්ඩල ණය
7. සහනශීලී පොලී අනුපාත මත වාහන ණය

**අයදුම්කරුවන් සඳහා පොදු උපදෙස්**

- සියලුම අයදුම්පත් සමඟ අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික සහ උප්පැන්න සහතිකය හා අනෙකුත් අදාළ සහතිකවල පිටපත් **සාම විනිසුරුවරයෙකු (JP)/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු විසින් සහතික** කොට සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක සහ ලිපිනයන්ද සහිතව **ලියාපදිංචි තැපෑලෙන් මෙම දැන්වීම පළවූ දින සිට දින 14 ක්** ඇතුළත **හෝ ඊට ප්‍රථම සභාපති, සී/ස ලංකා නැව් සංස්ථාව , නො.27, MICH ගොඩනැගිල්ල, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය) , කොළඹ 01** ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පත එවන ලිපි කවරයේ වම්පස ඉහල කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතුය.

- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.

- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

**ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමකට හේතු විය හැකිය. යම් ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

---

**සභාපති**
**සීමාසහිත ලංකා නැව් සංස්ථාව**
**අංක 27, MICH ගොඩනැගිල්ල**
**ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය)**
**කොළඹ 01**

වැඩි විස්තර සඳහා- (+94)011 249 7800, 264/251/258 දිගු, මානව සම්පත් අංශය

දිනය : 2026.06.03